Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

ශ්‍රේණිය 12 | විෂය නර්තනය | තුන්වන වාරය **B -10**

**නිපුණතාව 03 :** සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල ස්වරූපය හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.3** : වන්නම් ගායනය කරමින් බෙර/දවුල් වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.3** : වන්නම් ගයමින් බෙර/දවුල් වාදනය කරමු.

**ඉගෙනුම් පල :**

- නියමිත වන්නම්වල මූලික බෙර/දවුල් පද තාල තබමින් කියයි.
- මූලික බෙර පද ආශ්‍රිත අලංකාර බෙර/දවුල් පද හා කස්තිරම්/ඉරට්ටි/කලාසම් පද තාල තබමින් කියයි.
- අලංකාර බෙර/දවුල් පද වාදනය කරයි.
- ගායනය කරමින් අදාළ බෙර/දවුල් පද වාදනය කරයි.
- නිවැරදි අක්ෂර උත්පාදනය වන පරිදි කස්තිරම්/ඉරට්ටි/කලාසම් වාදනය කරයි.
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් කණ්ඩායම් වශයෙන් වාදනය ඉදිරිපත් කරයි.
- ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය වන අයුරින් ඒකල ව වාදනය කරයි.

<u>ශිෂයා කල යුතු කාර්යයන් -</u>

- අන්තර් ජාලය තුලින් හෝ ශ්‍රව්‍ය පට මගින් මුසලඩි / ගණපති / මයුරා යන වන්නම් වාදනය හොදින් ශ්‍රවනය කරන්න.
- වන්නම වලට අයත් මූලික බෙර පද අදාල තාල රූප වලට තාල තබා ඉන්පසුව වාදනය කරන්න.
- ඔබගේ පහසුව සදහා බෙර පද වෙන වෙනම ප්‍රස්තාර ගත කර ගන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි  පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය

## ඇගයීම්

- වන්නම්වලට අදාළ මූලික බෙර / දවුල් පද තාල තබා කියන්න.
- මූලික බෙර / දවුල් පදවලට අදාළ අලංකාර පද හා කස්තිරම් / ඉරට්ටි / කලාසම් තාල තබා කියන්න.
- මූලික බෙර පද / දවුල් පද, අලංකාර පද කස්තිරම් / ඉරට්ටි / කලාසම් වාදනය කරන්න.
- ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් සාමූහික ව හා ඒකල ව බෙර / දවුල් පද වාදන ඉදිරිපත් කරන්න.

පහත සඳහන්  ඇගයීම් ද සිදු කරන්න.

- සති පාසල් කාර්‍ය පත්‍රිකා -        12 නර්තනය තුන්වන වාරය A -10

පසු ක්‍රියාකාරකම්

- ලබා ගන්න ලද ශිල්පීය වාදන හැකියාව තුලින් ස්ව නිර්මානයක් කිරීමට උත්සහ ගන්න.
- වන්නම් තුනේම වාදන එකතුවක් සාදා ගන්න.
- ගුරුවරයාගේද සහය ලබාගෙන එය ප්‍රාසංගික නිර්මානයක් බවට පත් කර ගන්න.
- සුදුසු අවස්තාවක ප්‍රේක්ෂක රසවින්දනය සඳහා ඉදිරිපත් කරන්න.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය . රත්නපුර කලාපය .**